**රාජ්‍ය ආයතන වල තාවකාලික අතිරික්ත භාර අරමුදල - 2013**

-------------------------------------------------------------------

රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2005 අගෝස්තු 03 දින අත්සන් කරන ලද අංක 109 දරන භාර ඔප්පුවේ 23 වගන්තිය සමඟ සංයෝජීතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (2) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාම සඳහා මා විසින් ප්‍රසිද්ධ වෘත්තියේ නියැලෙන ගණකාධිකාරී සමාගමක සහය ලබාගන්නා ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට, අරමුදලේ කටයුතු වෙනුවෙන් විධිමත් පොත් සහ ගිණුම් අරමුදල පවත්වා තිබුණු බව හා අරමුදලේ කළමනාකරු විසින් මට සපයන ලද තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයෙන් දැක්වෙන කරුණු වලින් උද්ගත වන බලපෑම හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්වයක් දැක්වෙන අයුරින් 2013 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් පොත් ඒ සමඟ වාර්තා කර තිබුණු සටහන් සමඟ එකඟ වන බවත්ය.

**2.2 ප්‍රමාණවත් අධිකාර බලයක් නොමැති ගණුදෙනු සහ අනෙකුත් ලැබීම් සඳහා වූ ගිණුම්කරණ පිළියම්**

---------------------------------------------------------------------------------------------------

(අ) අරමුදල මඟින් රු.325,812,879 ක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත 2012 වර්ෂය සඳහා ලාභාංශ වශයෙන් ගෙවිය යුතුව තිබුණි. එසේ වුවත්, මෙම මුදල මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ව තිබුණු රු.810,589,692 ට එරෙහිව කිසිදු සාධාරණ පදනමකින් තොරව හා ලිඛිත අනුමැතියකින් තොරව එකිනෙකට හිලව් කර තිබුණි.

(ආ) රු.484,776,812 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු වෙනත් මුදල් ලෙස ගිණුම්ගත කර ශේෂ පත්‍රයේ දක්වා තිබුණ ද, මෙම මුදල සනාථ කර හෝ වගකීමක් ලෙස මහා භාණ්ඩාගාරයේ පොත්වල දක්වා නොතිබුණි. මේ අනුව මෙම මුදල අයකර ගැනීම අවිනිශ්චිත වේ.

**2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------------**

නීති,රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

---------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) 2005 අගෝස්තු 3 දින අත්සන් කරන ලද අංක 109 දරන භාර ඔප්පුවේ (ඒ) ඡේදයෙහි 12 වගන්තිය ප්‍රකාරව භාරකාර මණ්ඩලය මාස තුනකට වරක්වත් රැස්විය යුතුය. එසේ වුවත් සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් පවත්වා නොතිබුණි.

(ආ) 2006 ජුනි 27 දිනැති අවබෝධතා ගිවිසුමේ (MOU) විෂය අංක 06 ප්‍රකාරව, අරමුදලට දායක වන එක් එක් සහභාගිකත්ව රාජ්‍ය ආයතන වලින්, අවම වශයෙන් මාස හයකට වරක් ඔවුන්ගේ පුරෝකථනය කළ අරමුදල් ප්‍රවාහ විස්තර භාර කළමනාකරුට ඉදිරිපත් කරන ලෙස භාරකරුවන් ඉල්ලා සිටිය යුතුය. එසේ වුවත්, මෙවැනි පුරෝකථනය කරන ලද අරමුදලේ ප්‍රවාහ විස්තර සමාලෝචිත වර්ෂය තුළ දී භාර කළමනාකරුට ලැබී නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

මූල්‍ය ප්‍රතිඵල

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය ලාභාංශවලට පෙර රු.මිලියන 110.01 ක ශුද්ධ ආදායමක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභාංශ වලට පෙර ශුද්ධ ආදායම රු.මිලියන 1,113.49 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 1,003.48 ක් හෙවත් සියයට 90.12 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. ආයෝජන අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස පොළී ආදායම අඩුවී තිබීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ආපසු ගැනීම් රු.මිලියන 247.47 ක් වුවත්, සමාලෝචිත් වර්ෂය තුළ දී රාජ්‍ය ආයතන කිසිවක් අතිරික්ත අරමුදලේ තැන්පත් කර නොතිබුණි.

(ඇ) අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය ආයෝජන පොළිය වේ. එසේ වුවත්, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී ආයෝජන රු.මිලියන 246.30 කින් අඩු වී තිබුණි.

**4. පද්ධති සහ පාලන**

**---------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) සහභාගීත්ව රාජ්‍ය ආයතනවල පුරෝකථනය කරන ලද අරමුදලේ ප්‍රවාහ පාලනය
(ආ) ආපසු ගැනීම් පාලනය
(ඇ) භාරකරුවන්ගේ රැස්වීම් පැවැත්වීම